# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2003 අංක 22 දරන බීජ පනත

---

**[සහතිකය සටහන් කලේ 2003 ජූලි මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**2003 අගෝස්තු මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 13.50 යි.

තැපැල් ගාස්තුව : රු. 6.75 යි.

## 2003 අංක 22 දරන බීජ පනත

[සහතිකය සටහන් කළේ 2003 ජූලි මස 30 වන දින]

එල්. ඩී.– ඕ. 61/98.

**බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකභාවය විධිමත් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2003 අංක 22 දරන බීජ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

I වන කොටස

**පනත ක්‍රියාත්මක කිරීම**

**2.** (මින් මතු මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා, මේ පනතේ සාමාන්‍ය පරිපාලනය භාරව කටයුතු කළයුතු අතර, මේ පනත මගින් ඔහු වෙත පවරන ලද කර්තව්‍ය ඉටු කළ යුතු ය. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා පරිපාලනය භාරව කටයුතු කළ යුතුය.

**3.** මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා තමාට සහාය වීම පිණිස අවශ්‍ය විය හැකි, නිලධරයන් සංඛ්‍යාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලැබිය යුතු ය. එසේ නම් කරනු ලැබූ නිලධරයන් මෙහි මින් මතු "බලයලත් නිලධරයන්" යනුවෙන් හැඳින්විය යුතු ය. බලයලත් නිලධරයන්.

II වන කොටස

**ජාතික බීජ සභාව පිහිටුවීම**

**4.** (1) මේ පනතේ කාර්යයන් සඳහා (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික බීජ සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික බීජ සභාව පිහිටුවීම.

(2) සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම්—

(i) ලේකම්වරයා ;

(ii) අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(iii) (මේ පනතේ මින් මතු "අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීම භාර අධ්‍යක්ෂවරයා ;

(iv) ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ විධායක අධ්‍යක්ෂවරයා ; සහ

(v) 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ; සහ

(ආ) බීජ භාවිත කරන ගොවි ජනතාව නියෝජනය කරන පුද්ගලයන් දෙදෙනකු ඇතුළුව, බීජ නිෂ්පාදකයන් හා බීජ ආනයන කරුවන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හතර දෙනකුට නොවැඩි සංඛ්‍යාවක්.

(3) ලේකම්වරයා සභාවේ සභාපතිවරයා විය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

5. (1) ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කළහොත් මිස, සෑම පත්කළ සාමාජිකයකු ම, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(2) පත්කළ සාමාජිකයකු විසින් තත් කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක දී සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබූ විට බලාත්මක වන්නේ ය.

(3) යම් පත්කළ සාමාජිකයකු රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, ඒ සාමාජිකයා වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් යම් පුද්ගලයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) යම් පත්කළ සාමාජිකයකු අමාත්‍යවරයා විසින්, හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. එවිට ඒ සාමාජිකයා සිය ධුරය හිස් කර ඇති තැනැත්තකු ලෙස සැලකිය යුතු ය.

(5) යම් පත්කළ සාමාජිකයකු ඉල්ලා අස්වීමෙන්, ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කළහොත් ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය හැකි ය.

(6) කාලය ඉකුත්වීමෙන් ධුරය හිස් කරන පත්කළ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(7) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමික, සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

(8) මේ පනතේ වෙනත් විධිවිධානවලට හා ඒ යටතේ සාදන ලද යම් නියෝගයකට යටත්ව, සභාවේ රැස්වීම් සම්බන්ධ සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ ක්‍රියාවලිය සම්බන්ධ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට සභාවට හැකි ය.

6. මේ පනතේ විධිවිධානවලට යටත්ව — සභාවේ කර්තව්‍ය.

(අ) උසස්ම ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම සහතික කිරීම පිණිස මාර්ගෝපදේශ හා ප්‍රතිපත්ති සකස් කිරීම ;

(ආ) බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රගතිය කලින් කල සමාලෝචනය කිරීම ;

(ඇ) ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා ගොවීන්ට බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම පිළිබඳ වූ සියලුම කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයාට හා වෙනත් අදාළ නිලධාරීන්ට උපදෙස් දීම ;

(ඈ) බීජ හා රෝපණ ද්‍රව්‍ය කර්මාන්තය වැඩි දියුණු කිරීමේ අදහසින් බීජ හා රෝපණ ද්‍රව්‍යවල තත්ත්ව පාලන ප්‍රමිතීන් කලින් කල සමාලෝචනය කිරීම ;

(ඉ) වෙළෙඳපොළේ තිබෙන බීජ හා රෝපණ ද්‍රව්‍යවල තිබිය යුතු ප්‍රරෝහණය, ජීව්‍යතාවය, ප්‍රවේණික පාරිශුද්ධතාවය, භෞතික පාරිශුද්ධතාවය සහ බීජ හා රෝපණ ද්‍රව්‍යවල

පෙනුම සඳහා යෝග්‍ය අවම සීමාවන් ද සහ ප්‍රවේණික අපාරිශුද්ධතාව, හානි වූ බීජ, බීජවල තෙතමන ප්‍රමාණය සහ පලිබෝධ (වල් පැලෑටි බීජ ඇතුළුව) සඳහා උපරිම සීමාවන් ද ඇති කිරීම ;

(ඊ) වෙළෙඳපොළේ තිබෙන බීජ ඇසුරුම් හා රෝපණ ද්‍රව්‍ය සඳහා ලේබල් කිරීමේ අවම අවශ්‍යතාවයන් නිශ්චය කිරීම ;

(උ) වෙළෙඳපොළේ තිබෙන එක් එක් බීජ විශේෂයට, වර්ගයට හෝ ප්‍රභේදයට යෝග්‍ය බීජ ඇසුරුම්වල තත්ත්වය හා අවම පරිමාණය තීරණය කිරීම ; සහ

(ඌ) නව ශාක ප්‍රභේදයන් හා ශාක අභිජනකයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ග ගැනීම;

සභාවේ කර්තව්‍ය විය යුතු ය.

සභාවේ බලතල.

7. සභාවට පහත සඳහන් බලතල තිබිය යුතු ය :—

(අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍යායතනය මඟින් සලසනු ලබන යම් සේවා හෝ පහසුකම් සඳහා සහ බීජ පරිහරණය කරන්නන් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු නිර්දේශ කිරීම ;

(ආ) බීජ හා රෝපණ ද්‍රව්‍ය සඳහා ඇති අවශ්‍යතාවය හඳුනාගැනීම සහ උසස් ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම පිණිස තාක්ෂණික සහය ලබා දීමට පහසුකම් සැළසීම ;

(ඇ) පුද්ගලික අංශයේ බීජ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා රාජ්‍ය අංශයේ නියෝජ්‍යායතන සමඟ සම්බන්ධීකරණයක් ඇති කිරීම සහ බීජ හා රෝපණ ද්‍රව්‍යවලට අදාළ ගැටළු පිළිබඳව සළකා බැලීම ;

(ඈ) සක්‍රියතාවෙන් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය කර්මාන්තයක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සහ මානව සම්පත් ලබාගැනීම ; සහ

(ඉ) සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂ කමිටු පත්කිරීම.

## III වන කොටස

## ලියාපදිංචි කිරීමේ කාර්ය පටිපාටිය

බීජ පරිහරණය කරන්නන් ලියාපදිංචි කිරීම.

**8.** (1) සියලුම බීජ පරිහරණය කරන්නන් අධ්‍යක්ෂවරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) ලියාපදිංචි කිරීමක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම ලිඛිතව විය යුතු අතර, අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන ආකාරයට අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමක්—

(අ) ඉල්ලුම්කරු විසින් ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවූ විට නිකුත් කරනු ලැබිය යුතු ය ;

(ආ) ලිඛිතව විය යුතු අතර, ලියාපදිංචි කිරීම ප්‍රදානය කරන ලද්දේ යම් නියමයක් යටතේ ද, එම නියමයන් ප්‍රකාර ලියාපදිංචිය කලින් අවලංගු කරන ලද්දේ නම් මිස, අවුරුදු දෙකක කාලසීමාවක් එය බලාත්මකව පැවතිය යුතු ය ; සහ

(ඇ) ලියාපදිංචි කිරීම ප්‍රදානය කරනු ලබන්නේ යම් නියමයන් හා කොන්දේසිවලට යටත්ව ද එකී නියමයන් හා කොන්දේසි දැක්විය යුතු ය.

ලියාපදිංචිය අලුත් කරවා ගැනීම.

**9.** 8 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමක්, ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රයේ සඳහන් ඉකුත්වීමේ දිනයට පෙර අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අලුත් කරවා ගත යුතු ය.

ලියාපදිංචිය අවලංගු කිරීම.

**10.** (1) බීජ පරිහරණය කරන්නේ —

(අ) එම ලියාපදිංචිය සිදු කරන ලද්දේ යම් කොන්දේසි හා නියමයන්ට යටත්ව ද ඉන් යම් කොන්දේසියක් හෝ නියමයක් කඩ කර ඇති බවට ;

(ආ) එම ලියාපදිංචියේ දක්වා ඇති යම් විධාන ක්‍රියාවේ යෙදවීමට අපොහොසත් වී ඇති බවට ; සහ

(ඇ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ යම් වරදක් කර ඇති බවට,

අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වුවහොත්, ඔහු විසින් මේ පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචිය අවලංගු කළ හැකි ය.

(2) අවලංගු කිරීමේ දැන්වීම, ලියාපදිංචි කරන ලද බීජ පරිහරණය කරන්නා වෙත ලිඛිතව දැන්විය යුතු ය.

(3) (අ) ලියාපදිංචි කිරීමක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට;

(ආ) ලියාපදිංචි කිරීමක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට; හෝ

(ඇ) ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීමට,

අධ්‍යක්ෂවරයා විසින් ගනු ලැබූ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු, ඒ තීරණය ඔහු වෙත දැනුම් දීමෙන් දින තිහක් ඇතුළත, ලේකම්වරයා වෙත ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු සඳහන් කරමින්, අභියාචනයක් ලිඛිතව ඉදිරිපත් කළ හැකි අතර, එම අභියාචනය 15 වන වගන්තිය යටතේ පත්කරන ලද අභියාචන මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

## IV වන කොටස

## කාර්ය පටිපාටිය

පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා පරිශ්‍රයට ඇතුළුවීම.

11. (1) යම් පරිශ්‍රයක පවතින බීජ හා රෝපණ ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ සහ පරීක්ෂණ පැවැත්වීමේ කාර්යය සඳහා සහ ඒ ද්‍රව්‍යවල උචිත සාම්පල පරීක්ෂණ පැවැත්වීමේ හා පරීක්ෂා කිරීමේ කාර්ය සඳහා ලබාගැනීමට යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සාධාරණ හේතු ඇති බවට, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයෙක්, සහායකයන් ඇතිව හෝ සහායකයන් නොමැතිව සියලුම සාධාරණ අවස්ථාවන්හි දී ඇතුළුවීම නිත්‍යානුකූල වන අතර, අවස්ථානෝචිත පරිදි, ඒ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය භාවිත කරන්නා, නිෂ්පාදකයා හෝ ආනයනකරු හෝ එම පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු එවැනි පරීක්ෂා කිරීමකට හෝ පරීක්ෂණයකට අවශ්‍ය සියලු සාධාරණ පහසුකම් සැලැස්විය යුතු ය. පරිශ්‍රයකට ඇතුළුවීමට පෙර බලයලත් නිලධරයාගේ අනන්‍යතාවය, පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට පෙන්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරීක්ෂා කිරීමෙන් සහ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව කිසියම් පරිශ්‍රයක ගබඩා කර ඇති, තත්ව සමතය කර ඇති හෝ විකිණීම සඳහා ඉදිරිපත් කර ඇති යම් බීජ හා රෝපණ ද්‍රව්‍ය මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක විධිවිධාන උල්ලංඝනය කරනු ලබන බවට හෝ සභාව විසින් නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූල නොවන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා සෑහීමකට පත්වන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා විසින් තම තීරණය සහ එම තීරණයට හේතු ද ලිඛිතව ඒ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය භාවිත කරන්නාට, නිෂ්පාදකයාට හෝ ආනයනකරුට හෝ පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට දැන්විය යුතු අතර, ඒ බීජ හෝ රෝපණ ද්‍රව්‍යවලට අදාළව එම විධානයේ දක්වා ඇති ගතයුතු වැළැක්වීමේ පියවර හෝ ක්‍රියාත්මක කළ යුතු කටයුතු කරන ලෙස අවස්ථාවෝචිත පරිදි, විධාන කළ යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි ඒ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයා හෝ ආනයනකරු හෝ ඒ පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා විසින් කරන ලද විධානයට අනුව කටයුතු කළයුතු අතර, බීජ හෝ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයා හෝ ආනයනකරු හෝ පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා මගින් 15 වන වගන්තිය යටතේ අභියාචන මණ්ඩලයේ තීරණයක් සඳහා අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් පමණක් එසේ නොකළ යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා හෝ ඔවුන්ට සහාය වන තැනැත්තකු පරිශ්‍රයට ඇතුළුවීම ආදිය හේතුකොට අයුතු ලෙස ඇතුළුවන්නකු ලෙස නොසැලකිය යුතු බව.

12. අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා හෝ ඔවුනට සහාය වන යම් තැනැත්තකු, යම් පරිශ්‍රයකට ඇතුළුවීමේ හේතුවෙන් හෝ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ කරන ලද යම් ක්‍රියාවක් හෝ කරන ලද යම් දෙයක් හේතුකොට ගෙන, අයුතු ලෙස ඇතුළුවන්නකු ලෙස සලකනු නොලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීම අත්හැරීමේ හේතුව මත, එසේ ක්‍රියාත්මක කිරීම හෝ අත්හැරීම කරන ලද්දේ අසද්භාවය හෝ සාධාරණ සහ විය හැකි වූ හේතුවක් නොමැතිව නම් මිස, එසේ ක්‍රියාත්මක කිරීම හෝ අත්හැරීම සම්බන්ධයෙන් යම් අලාභයකට හෝ නඩු පැවරීමකට හෝ යටත් නොවිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ බලයලත් නිලධරයාට පියවර ගැනීමට හෝ වැඩ ක්‍රියාත්මක කිරීමට සහ ඊට වැය වූ වියදම් අයකර ගැනීමට ඇති බලය.

**13.** (1) ඉහත 11 වන වගන්තිය යටතේ, යම් පරිශ්‍රයක හෝ පරිශ්‍රයක් මත ඇති බීජ හෝ රෝපණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් යම් පියවරක් ගැනීමට හෝ වැඩ ක්‍රියාත්මක කිරීමට ඒ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය භාවිත කරන්නාට, නිෂ්පාදකයාට හෝ ආනයනකරුට හෝ යම් පරිශ්‍රයක අයිතිකරුවකුට හෝ පදිංචිකරුවකුට නියම කර හෝ විධාන කර ඇති අවස්ථාවක, ඒ නියමය හෝ විධානය අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තා පැහැර හරින්නේ නම්, නොසලකා හරින්නේ නම් හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ බලයලත් නිලධරයාට සහායකයන් ඇතිව හෝ නැතිව ඒ පියවර ගැනීමේ හෝ වැඩ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ඒ පරිශ්‍රයට ඇතුළු විය හැකි ය.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ යම් පරිශ්‍රයකට ඇතුළුවන අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයෙක්, (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම පහසු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි උපකරණ, යන්ත්‍රෝපකරණ සහ වාහන ඔහු විසින් රැගෙන යා හැකි ය.

(3) ඉහත (1) වන උපවගන්තිය යටතේ යම් පරිශ්‍රයක හෝ පරිශ්‍රයක් මත යම් පියවර ගැනීමේ හෝ යම් වැඩක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ යම් බලයලත් නිලධරයකු විසින් දරන ලද සියලු සාධාරණ වියදම් සහ රජය විසින් දරන ලද සියලු වියදම් එම පියවර ගැනීමට හෝ එම වැඩය ක්‍රියාත්මක කිරීමට මේ වගන්තිය යටතේ නියමය ලද හෝ විධානය ලද තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු අතර, එම වියදම් එම තැනැත්තාගෙන් මෙහි මින් මතු දැක්වෙන පරිදි අයකර ගත හැකි ය.

(4) ඉහත (3) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු සියලු සාධාරණ වියදම් එම තැනැත්තා පදිංචි ප්‍රදේශයේ හෝ යම් පියවරක් ගැනීමට හෝ වැඩක් ක්‍රියාත්මක කිරීමට තිබූ ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ තත්කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් බලයලත් නිලධරයකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, එම අධිකරණය විසින් පනවනු ලබන දඩයක ආකාරයට අයකර ගනු ලැබිය හැකි අතර, එම වියදමේ ප්‍රමාණය එම අධිකරණය විසින් ස්වකීය අධිකරණ බලය සාමාන්‍ය ලෙස ක්‍රියාත්මක කිරීමේ දී පනවනු ලැබිය හැකි දඩයක ප්‍රමාණයට වඩා වැඩි වුවද එය නොතකා අයකර ගනු ලැබිය හැකි ය.

(5) යම් තැනැත්තකුගෙන් (4) වන උපවගන්තිය යටතේ අයවිය යුතු වියදම් අයකර ගැනීමේ හේතුවෙන්, මෙම වගන්තිය යටතේ කරන ලද නියමයකට හෝ විධානයකට එකඟව ක්‍රියා කිරීමට එම තැනැත්තා අපොහොසත්වීමේ, පැහැර හැරීමේ, ප්‍රතික්ෂේප කිරීමේ හේතුව නිසා ඔහු යටත් විය හැකි යම් වරදක් සඳහා වූ යම් නඩු පැවරීමකින්, එම තැනැත්තා මුදා හරිනු නොලැබිය යුතු ය.

V වන කොටස

**බීජ සහතික කිරීමේ සේවාව**

14. (1) අධ්‍යක්ෂවරයා විසින් — බීජ සහතික කිරීමේ සේවාව.

(අ) ශ්‍රී ලංකාවේ වවනු ලබන බීජ සහ රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ අනන්‍ය අයිතිය යෙදවීම ;

(ආ) බීජ සහතික කිරීමේ සේවාවේ සලකුණ හෝ මුද්‍රාව සහිතව මුද්‍රා, ස්ටිකර්, මුද්දර සහ ලේබල් නිකුත් කිරීම ;

(ඇ) දේශීය වශයෙන් නිෂ්පාදිත යම් භෝග ප්‍රභේදයකට අයත් හෝ දෙමුහුන් බීජ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවය මගින් ප්‍රකාශයට පත් කරන ලද හා ක්‍රියාත්මක කරනු ලබන සහතික කළ බීජ නිෂ්පාදනය සඳහා වූ රීතිවලට අනුකූලව නිෂ්පාදනය කරනු ලැබ නොමැත්තේ නම්, එකී ප්‍රභේදයක හෝ දෙමුහුනක බීජ ඒ භෝග ප්‍රභේදයේ හෝ දෙමුහුනකට අයත් "සහතික කළ බීජ" ලෙස ගෙන හැර දැක්වීම හා විකිණීම තහනම් කළ යුතු අතර, ආනයනය කළ බීජ සම්බන්ධයෙන් වන විට, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවය විසින් ඒ බීජවල මූලාරම්භක රටේ බීජ සහතික කිරීමේ නිල ක්‍රියා පිළිවෙත පිළිගෙන ඇත්තේ නම් මිස, යම් භෝග ප්‍රභේදයක් හෝ දෙමුහුනක යම් බීජ ඒ භෝගයේ, ප්‍රභේදයේ හෝ දෙමුහුනකට අයත් "සහතික කළ බීජ" ලෙස ගෙන හැර දැක්වීම හා විකිණීම තහනම් කිරීම ;

(ඇ) සහතික කරන ලද බීජ නිෂ්පාදන හා සැකසීමේ කටයුතු මෙහෙයවිය යුතු අතර ඒවායේ ප්‍රමිතීන් සහතික කිරීමේ ප්‍රමිතියට අනුකූලදැයි පරීක්ෂා කිරීම ;

(ඉ) පරිශ්‍රවලට ඇතුළු වී බීජ සැකසීමේ හා ගබඩා කිරීමේ පහසුකම් සෝදිසි කර බැලීම ;

(ඊ) බීජ සංසරණය සහ අනන්‍යතාව පිළිබඳ ලේඛන පිරික්සීම ;

(උ) සභාව විසින් තීරණය කරන ලද බීජ සහතික කිරීමේ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම ;

(ඌ) ක්ෂේත්‍ර පරීක්ෂණය, බීජ පරීක්ෂණ කටයුතු, බීජ සකස් කිරීමේ කටයුතු, බීජ සාම්පල් ලබා ගැනීම සහ සහතික කිරීම සඳහා යෝග්‍ය වූ බීජ තොග සඳහා සහතික කළ ලේබල් යෙදීම යන කාර්යයන්හි දී අනුමත ක්‍රියා පරිපාටියක් භාවිත කිරීම ;

(එ) සහතික කරන ලද බීජ නියමිත ආකාරයෙන් අසුරා ඇති බවත්, මුද්‍රා තබා ඇති බවත්, ඊට ලේබල් යොදා ඇති බවත්, සහතික කිරීම ;

(ඒ) දේශීය වශයෙන් නිෂ්පාදිත බීජවල සහ ආනයනය කරනු ලැබූ බීජවල සාම්පල් ගැනීම හා නියමිත ප්‍රමිතීන් වලට අනුකූලවේදැ යි පිරික්සීම :

(ඔ) බීජ සහතික කිරීම සඳහා ප්‍රමිතීන් පිහිටුවා ඒවා ප්‍රකාශයට පත් කිරීම ; සහ

(ඕ) සහතික කරන ලද බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයන්ගේ සහ සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයක් පවත්වාගෙන යාම ද ප්‍රකාශයට පත් කිරීම ද කළ යුතු ය.

(2) මෙම වගන්තියේ කාර්ය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාර නියමිත පරීක්ෂණාගාර ලෙස සැලකිය යුතු ය.

## VI වන කොටස

### අභියාචන

15. (1) මේ පනතේ කාර්යයන් සඳහා අමාත්‍යවරයා විසින් අභියාචන මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය. අභියාචන.

(2) අභියාචන මණ්ඩලය, ලේකම්වරයා, බීජ තාක්ෂණඥයකු හා බීජ ව්‍යාධිවේදියකුගෙන් සමන්විත විය යුතු ය.

(3) ලේකම්වරයා එම අභියාචන මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

(4) ලේකම්වරයා විසින් අභියාචනයක් බාර ගැනීමෙන් පසු ඒ දිනයේ සිට දින හැටක් ඉකුත් වීමට පෙර අභියාචන මණ්ඩලය විසින් එහි තීරණය ලබා දිය යුතු ය.

(5) අභියාචන මණ්ඩලයේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු අතර ලේකම්වරයා විසින් එම තීරණය වහාම අභියාචකට සහ අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතු ය.

(6) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් අභියාචන මණ්ඩලයේ සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය හැකි ය.

## VII වන කොටස

### වැරදි සහ දණ්ඩන

16. (1) මේ පනතේ යම් විධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් නීත්‍යානුකූල අධිකාරය හෝ අවසරය නොමැතිව කඩ කරන හෝ මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ ඔහු විසින් නොකළ යුතු හෝ අත් නොහැරිය යුතු යම් දෙයක් ඔහු විසින් කරන හෝ අත්හරින නැතහොත් අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ යම් බලයලත් නිලධරයකුට හෝ ඔවුන්ට සහාය වන යම් තැනැත්තකුට මේ පනතේ යම් විධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ දී, ප්‍රතිරෝධය පාන හෝ අවහිර කරන නැතහොත් ප්‍රතිරෝධය පෑමට හෝ අවහිර කිරීමට සහාය වන හෝ ප්‍රතිරෝධය පෑමට හෝ අවහිර කිරීමට යම් තැනැත්තකු පොළඹවන ඕනෑම තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේ ය. වැරදි.

(2) මේ පනත යටතේ වරදක් කරන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී ලඝු කාර්ය පටිපාටිය අනුව විභාග කොට වරදකරු කරනු ලැබූ විට මාස එකකට නොඅඩු සහ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පනස් දහසකට නොඅඩු දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි.

**17.** යම් පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක —

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකුව, කළමනාකරුවකුව, ලේකම්ව හෝ ඒ සමාන වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක්ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය වෙළෙඳ ආයතනයක් නම්, ඒ වෙළෙඳ ආයතනයේ හවුල්කරුවකුව සහ කළමනාකරුවකුව, සිටි සෑම තැනැත්තෙක්ම,

ඒ වරද තමාගේ එකඟත්වය හෝ දැනීම නොමැතිව කරන ලද බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට තමා නිසි ලෙස සියලු උද්යෝගයෙන් කටයුතු කළ බව හෝ ඔහු ඔප්පු කළහොත් මිස, ඒ වරද කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

නියෝග.

**18.** (1) නියෝග සෑදිය යුතු කරුණක් ලෙස මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් අවශ්‍ය වූ හෝ බලය දෙනු ලැබ ඇති හෝ යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවලට අගතියක් නොමැති වන සේ අමාත්‍යවරයා විසින් විශේෂයෙන්ම පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකි ය :–

(අ) අලෙවි කරනු ලැබීමට ඉඩදිය හැකි දේශීය වශයෙන් නිෂ්පාදිත හෝ ආනයනික බීජවල හා රෝපණ ද්‍රව්‍යවල තත්ව හා අලෙවි කරනු ලබන බීජ හා රෝපණ ද්‍රව්‍යවල යෙදිය යුතු ලේබල් තුළ අඩංගු විය යුතු අවශ්‍යතාවයන් :

(ආ) බීජවල සහ රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකභාවයේ ප්‍රමිති සඳහා සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ආකාරය :

(ඇ) බීජ භාවිත කරන්නන් ආරක්ෂා කිරීම හා බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ඉහල නැංවීම :

(ඈ) බීජ හා රෝපණ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම, සාම්පල් ගැනීම, විශ්ලේෂණය, පරීක්ෂණය හෝ පිරික්සුම සඳහා වූ ක්‍රියා පටිපාටිය. :

(ඉ) ලේබල් කිරීමේ සහ බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලේබල්වල අඩංගු කරනු ලැබිය යුතු විස්තර නියම කිරීමේ ක්‍රියා පටිපාටිය සහ උසස් තත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා වූ රීති සහ පරිචය පිළිබඳ පටිපාටිය ;

(ඊ) කමිටු පිහිටුවීම සහ එහි කර්තව්‍ය :

(උ) විධිමත් කරන ලද බීජ සහ රෝපණ ද්‍රව්‍ය විශේෂයන්, වර්ග සහ ප්‍රභේද වශයෙන් විශේෂයෙන් නියම කිරීම :

(ඌ) පරීක්ෂණ සඳහා වූ ක්‍රියා පටිපාටීන් සහ ප්‍රමිතීන් : සහ

(එ) සපයනු ලැබූ සේවා සහ පහසුකම් සඳහා අය කළ යුතු ගාස්තු නිශ්චය කිරීම.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් වන යම් පසු දිනක සිට හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමතය සඳහා, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනනුමත දින සිට ඒ යටතේ එතෙක් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ යම් දිනයක සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස (4) වන උපවගන්තිය යටතේ සලකනු ලබන විට, ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති.

**19.** රීති සෑදීමට මේ පනතින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

පනත අදාළ කර ගැනීම.

**20.** යම් තැනැත්තකු විසින් වවනු ලැබූ හා තමාගේම පරිශ්‍රය තුළ දී ඔහු විසින් වෙනත් පුද්ගලයකු හට ඇපිරීමේ හෝ රෝපණය කිරීමේ කාර්ය සඳහා එම තැනැත්තාට සෘජුව විකුණනු ලැබූ හෝ බාරදෙනු ලැබූ යම් වර්ගයකට හෝ ප්‍රභේදයකට අයත් බීජ සම්බන්ධයෙන් මේ පනතේ කිසිවක් අදාළ නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**21.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**22.** පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ–

"සහතික කළ බීජ" යන්නෙන්, මෙම පනතේ 14 වන වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රමිතීන් හා පටිපාටි අනුව නිෂ්පාදනය කරනු ලැබ, සහතික කළ බීජ ලෙස ලේබල් යෙදූ අභිජනන බීජ, අන්තිවරම් බීජ, ලියාපදිංචි බීජ, පෙරමූලික බීජ, මූලික බීජ, සම්මත බීජ හෝ ආරම්භක බීජ අදහස් කෙරේ ;

"ආනයනකරු" යන්නෙන්, යම් බීජ හෝ රෝපණ ද්‍රව්‍ය ශ්‍රී ලංකාවට ගොඩබානු ලැබුවේ හෝ ඇතුල් වූයේ යම් තැනැත්තකුගේ ක්‍රියාවක් මගින් ද, ඒ තැනැත්තා අදහස් වේ ;

"පළිබෝධය" යන්නෙන්, යම් ශාකයකට හෝ ශාක නිෂ්පාදනයකට හානි කිරීමට හෝ අලාභ කිරීමට හෝ ආර්ථිකමය පාඩු සිදු කිරීමට හැකියාව ඇති යම් ජෛව කාරකයක් අදහස් වන අතර, එයට වල්පැළෑටි බීජ ද ඇතුළත් වේ ;

"පරිශ්‍රය" යන්නෙන්, ශාක තබා ගැනීම, ගබඩා කිරීම, සකස් කිරීම, ප්‍රතිරෝපණය හෝ වැවීම සඳහා හෝ බීජ තබා ගැනීම හෝ ගබඩා කිරීම සඳහා ද සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් භාවිත කරනු ලබන යම් ඉඩමක්, ගොඩනැගිල්ලක්, ආයතනයක්, ගබඩාවක්, කන්ටේනරයක්, වාහනයක්, යාත්‍රාවක් හෝ වෙනත් ගමනාගමන ක්‍රමයක් ද ඇතුළත් වේ ;

"නියමිත" යන්නෙන්, නියෝග මගින් නියමිත බව අදහස් වේ ;

"ලේකම්වරයා" යන්නෙන්, කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ ;

"බීජ" යන්නෙන්, (1) ප්‍රරෝහණය වී පැළයක් බවට පරිවර්තනය වීමට සූදානම්, කලලයක් රැගත් ශාකයක සංසේචනය වී පරිණත වූ කොටස ;

(2) බීජ අර්තාපල්, බල්බ, රයිසෝම ; සහ

(3) රෝපණ ද්‍රව්‍ය.

අදහස් වේ ;

"බීජ පරිහරණය කරන්නකු" යන්නෙන්, බීජ නිපදවන්නකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු, සකස් කරන්නකු, නැවත ඇසුරුම්කරන්නකු, නියෝජිතයකු හෝ සිල්ලර වෙළෙන්දකු වශයෙන් ශ්‍රී ලංකාවේ වෙළෙඳපලට බීජ ඉදිරිපත් කිරීමට සැලැස්වීම සම්බන්ධයෙන් වග කිවයුතු තැනැත්තකු අදහස් වේ ;

"බීජ තොගය" යන්නෙන්, ලේබලයේ දක්වා ඇති සාධක, පිළිගත හැකි පරාසයක් තුළ මිනැම කොටසක් හෝ බීජ මල්ලක ඒකාකාරීව ඇති තොග අංකයකින් හඳුන්වනු ලබන නිශ්චිත බීජ ප්‍රමාණයක් අදහස් වේ ; සහ

"ප්‍රභේදය" යනු, පියවි ඇසින් සම වර්ගිකයන්ගෙන් පැහැදිලිවම වෙනස වෙන්කරගත හැකි, යටත් පිරිසෙයින් එකද ලක්ෂණයක්වත් සහිත වූ ද අන්තර් ප්‍රවේණික ශාඛ ද ඇතුළුව ප්‍රතිවාරණයෙන් පසුව ප්‍රමාණවත් අන්දමින් ස්ථායී හා ඒකාකාරී වන්නා වූ ද වර්ගීකරණයේ පහළම තත්වයේ ඇති ජීවී කාණ්ඩයක් තුළ පවත්නා ශාඛ සමූහයකි.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.